# අධ්‍යාපන මනෝවිද්‍යාවේ කාර්යභාරය

**එච්.එම්. සමරකෝන් බණ්ඩා**

අධ්‍යාපනික මනෝවිද්‍යාවේ කාර්යභාරය මෙතෙකැයි සීමාකර දැක්වීම අපහසු ය. එමෙන් ම අධ්‍යාපනික සංවර්ධනය හා අධ්‍යාපන මනෝවිද්‍යාව අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධතාවයකි. සමාජ අභිවෘද්ධිය සඳහා පදනම් වන ඵලදායි අධ්‍යාපන ක්‍රියාවලියකට සෑම ආකාරයෙන් ම විද්‍යාත්මක මඟ පෙන්වීමක් කෙරෙන අධ්‍යාපන මනෝවිද්‍යාව කෙරෙහි අධ්‍යාපනඥයින් මහත් බලාපොරොත්තු තබා ගෙන ඇති බව ඉතාමත් පැහැදිලි ය. එම නිසා පාසල පමණක් නොව විශ්ව අධ්‍යාපන ක්‍රියාවලිය ම සංවර්ධනය කිරීමට මඟ පෙන්වන අසහාය කාර්යභාරයක් අධ්‍යාපන මනෝවිද්‍යාව සතුව පවතින බව පෙන්වා දිය හැකි ය. එම නිසා අධ්‍යාපන මනෝවිද්‍යාව කෙරෙහි පාසල් සිසුන්, ගුරුවරුන්, පාසල් ප්‍රධානීන්, කළමනාකරුවන්, පාසල් පරිපාලකයින්, අධීක්ෂකවරුන්, විෂයමාලා සම්පාදකයින්, ප්‍රතිපත්ති සකස් කරන්නන්, දෙමාපියන්, භාරකරුවන්, ආදි ශිෂ්‍යයින්, වැඩිහිටියන් සහ අනෙකුත් පාසල් අධ්‍යාපනඥයින් හා බැඳුණු ප්‍රජාව මහත් බලාපොරොත්තු තබාගෙන ඇති බව පෙන්වා දිය හැකි ය. එම නිසා අධ්‍යාපන මනෝවිද්‍යාවේ කාර්යභාරය කුමක්දැ'යි විමසා බැලීම අවබෝධ කර ගැනීම බෙහෙවින් ම කාලෝචිත වේ.

මෙම ශාස්ත්‍රිය විග්‍රහයේ දී මනෝවිද්‍යාව හා අධ්‍යාපන මනෝවිද්‍යාව යනු කුමක් ද? අධ්‍යාපන මනෝවිද්‍යාවේ ආරම්භය හා විකාශනය කෙසේ සිදු වී ද යන්න පිළිබඳ ව සංක්ෂිප්ත ව අවධානය යොමු කරනු ලැබේ. මේ අතර ඉතා පුළුල් ලෙස අධ්‍යාපන මනෝවිද්‍යාවෙන් ඉටු කෙරෙන කාර්යභාරය හා එහි වැදගත්කම විමසීමකට ලක් කෙරේ. විශේෂයෙන් ම, ශිෂ්‍යයා හඳුනා ගැනීම තමා තේරුම් ගැනීම, පුද්ගල විවිධත්වය තේරුම් ගැනීම, චිත්තවේග තත්වයන් අවබෝධ කර ගැනීම, ගැටලු අවබෝධ කර ගැනීම හා මඟ පෙන්වීම අන්තර් සම්බන්ධතා ගොඩනගා ගැනීම, ඉගෙනීම, ඉගැන්වීම, උපායමාර්ග භාවිත කිරීම, පෙළඹවීම, වාචික හා අවාචික

සන්නිවේදනය, පංති කාමර කළමනාකරණය, ඇගයීම, උපදේශන කාර්යය, විෂය හා පාඩමේ අරමුණ තීරණය කිරීම, චරිත සංවර්ධනය, මානසික හා ශාරීරික ගැටලු අවබෝධ කර ගැනීම හා විසඳුම් සඳහා මග පෙන්වීම පරිසර සංවර්ධනය යනාදී විවිධ අංශ සඳහා අධ්‍යාපන මනෝවිද්‍යාවෙන් සිදුවන මෙහෙය විශේෂයෙන් අවබෝධ කර ගැනීම ඵලදායි අධ්‍යාපන ක්‍රියාවලියක් ගොඩ නැගීමට බෙහෙවින් ම ප්‍රයෝජනවත් වේ.

මනෝවිද්‍යාව යන වචනය ඉංග්‍රීසි භාෂාවේ Psychology යන වචනයෙන් ව්‍යවහාර වන බව (Oxford Dictionary, 2006 :1241) පෙනී යයි. ඉංග්‍රීසි Psychology යන වචනය සැකසී ඇත්තේ Phyche (සයකි) සහ Logos (ලෝගෝස්) යන ග්‍රීක වචනවලිනි. මෙහිදී Psyche යන ග්‍රීක වචනයේ අර්ථය ආත්මය යන්නයි. Logos යන වචනයෙහි තේරුම විද්‍යාව යන්නයි. ඒ අනුව සිත පිළිබඳ ව විද්‍යාව නැතහොත් ආත්මය පිළිබඳ ඉගැන්වෙන විද්‍යාව ලෙස (ජා.අ.ආ. 1989: 9) අවබෝධ කර ගත හැකි ය. සෑම මිනිස් චර්යාවක ම මූලිකත්වය ගෙන සිත ක්‍රියා කරන බව ධම්මපදය (2015: 1) පෙන්වා දෙයි. කෙසේ වෙතත් අද වන විට මනෝවිද්‍යාව නිරීක්ෂණය කළ හැකි චර්යාවන් හා සම්බන්ධ වාස්තවික අධ්‍යයනයක් ලෙස සංවර්ධනය වී ඇති බව තහවුරු වී ඇත. එනම් මිනිස් ස්වභාවය හා මානව චර්යාව අධ්‍යයනය කිරීමේ විද්‍යාවක් (Psychology is the science of human nature and human behaviour) ලෙස සැලකිය හැකි බව (handbook of education psychology, 1996: 1) අවබෝධ කර ගත හැකි ය. මේ අනුව අධ්‍යාපන මනෝවිද්‍යාවේ කාර්යභාරය කුමක්දැ'යි විමසා බැලීම වැදගත් වේ.

උපදේශන සේවාව සඳහා මග පෙන්වීම වැදගත් කාර්යයකි. අධ්‍යාපන ක්‍රියාවලියේ උපදේශන සේවාවට හිමිවන්නේ ඉතා වැදගත් තැනකි. පාසල් සිසුන්ට ඇතිවන ගැටලු විවිධ වේ. විශේෂයෙන් ම ශාරිරික ගැටලු (Physical Problem) මෙන්ම මානසික ගැටලු (Mental Problem) ඇති වේ. මෙම ගැටලු විසඳීමට ගුරුවරයා කැපවිය යුතු ය. මේ පිළිබඳ අදහස් දක්වන ක්‍රිෂ්ණමූර්ති පෙන්වා දී ඇත්තේ සිසුවාගේ මෙම ගැටලු විසඳා ගැනීමට ඇප කැපවූ කැක්කුමක් නැති අය ගුරු වෘත්තියට ප්‍රවිශ්ඨ නොවිය යුතු බව ය. මේ සඳහා ගුරුවරයා දැනුවත්

කිරීම පුහුණු කිරීම අධ්‍යාපන මනෝ විද්‍යාත්මක පදනමක් සහිත ව සිදු කළ යුතු ය.

පාසල් ළමුන්ට ඇතිවන ගැටලු විවිධ වන අතර ඒවා හඳුනා ගැනීම සඳහා ගුරුවරයාට අධ්‍යාපන මනෝවිද්‍යාව ප්‍රබල මඟ පෙන්වීමක් කරයි. විශේෂයෙන් ම පාසල් සිසුන්ට අමතක වීම, උනන්දුව අඩුවීම, නිදිමත ගතිය, අවධානය අඩු බව, සාධන මට්ටම පහළ බැසීම, කියවීමේ ලිවීමේ දුෂ්කරතා, විෂයයන් එපා වීම, පැමිණීම දුර්වල වීම, විභාග භීතිකාව, පාසල එපා වීම, ප්‍රේම සබඳතා පිළිබඳ ගැටලු, අධ්‍යයන ඉලක්ක බිඳ වැටීම වැනි අධ්‍යාපන ගැටලු රාශියක් ඇති වේ. මේ අතර ලිංගික ගැටලු මත්ද්‍රව්‍ය භාවිතය, ආර්ථික ගැටලු, සංස්කෘතික ගැටලු, පවුල ආශ්‍රිත ගැටලු, පරිසරය හා ස්වභාවික විපත් ආශ්‍රිත ගැටලු ඇතිවිය හැකි ය. මෙම ගැටලු අවබෝධ කර ගැනීම සඳහා සහ අධ්‍යයනය කර ගැනීමට මනෝවිද්‍යාව ප්‍රබල මඟ පෙන්වීමක් සිදු කෙරේ.

උපදේශන ක්‍රියාවලිය උපදේශන සේවය ක්‍රියාවට නැගීමේ දී මෙම ගැටලු විසඳීම පිණිස උපදේශන කුසලතා (Counseling skills) යොදා ගත යුතු ය. මෙම කුසලතා උපදේශනයෙහි යෙදෙන ගුරුවරයාට සංවර්ධනය කර ගත හැකි එකම මාර්ගය උපදේශන න්‍යායයන් බව සෙලිග්මාන් (Sligman, 2010) පෙන්වා දෙයි.

උපදේශන ක්‍රියාවලියට, අවශ්‍ය මඟ පෙන්වන න්‍යායයන් මනෝවිද්‍යාව පදනම් කර ගෙන ගොඩනැගී ඇති බව (හපුආරච්චි, 2012ඃ 19) පෙන්වා දිය හැකි ය. මෙහිදී මනෝවිශ්ලේෂණවාදී උපදේශනය ඇඩ්ලරියානු උපදේශනය, චර්යාවාදී උපදේශනය, ගෙස්ටෝල්ට් උපදේශනය, මානුෂවාදී උපදේශනය, සංදෘෂ්ටිකවාදී උපදේශනය, ප්‍රජානන උපදේශනය හා සමාජ යථාර්තවාදී උපදේශනය, යනාදී වශයෙන් විවිධ මනෝවිද්‍යාත්මක උපදේශන න්‍යායයන්ගෙන් ලැබෙන මඟ පෙන්වීම අතිශයින්ම වැදගත් ය.

අධ්‍යාපන මනෝවිද්‍යාව ඔස්සේ පාසල් සිසුන් තුළ ඇතිවන විවිධ කායික මානසික ව්‍යාධීන් සඳහා අවශ්‍ය ප්‍රතිකර්ම කරනු ලැබේ. විවිධ ගැටලු නිසා ඇතිවන ආතතිය (Stress) කාංසාව (Anxiety) සහ මානසික අවපීඩනය (Depression) සඳහා මනෝවිද්‍යාත්මක ප්‍රතිකර්ම

කළ (Geddens and Groeset, 1999) හැකි ය. සිසුන් තුළ අධ්‍යාපනික ගැටලු හේතු කොට ගෙන ඕටිසම්, ඩිමෙන්ෂියා, හිස්ටිරියා, පශ්චාත් ව්‍යසන ක්ලමථ ආක්‍රමතා (PTSD) භීතිකාව (Phobia) වැනි විවිධ වූ මානසික ව්‍යාධි (Mental disorders) දැක්විය හැකි ය. මෙලෙස ම මෙවැනි අක්‍රමතා හඳුනා ගැනීමට ජීවිත අත්දැකීම් මෙන්ම පුළුල් මනෝවිද්‍යා දැනුමක් අවශ්‍ය වේ. අදාල ගැටලු විශ්ලේෂණය කර ගැනීමටත් ඒවාට ප්‍රතිකර්ම කිරීමටත් අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳ අවබෝධයක් ලබා තිබීම බෙහෙවින්ම ප්‍රයෝජනවත් වේ.

ඉගෙනීම සඳහා සිසුන් පෙළඹවීමට අවශ්‍ය මඟ පෙන්වීම අධ්‍යාපන මනෝවිද්‍යාවේ ප්‍රධානතම කාර්යයකි. මේ පිළිබඳ අදහස් දක්වන ලොවෙල් (Lovel, 1964) පෙන්වා දෙන්නේ පෙළඹවීමෙන් තොරව ඉගැන්වීම බෙහෙවින් ම අසාර්ථක බව ය. පෙළඹවීම නිතර ම ප්‍රායෝගික බව අවදි කරයි. ප්‍රියජනක බව හෙවත් කැමැත්ත අවධානයේ මවයි. අවධානය ඉගෙනීමේ මවයි. (Motivation arothses interest, interest is the mother of attention and attention is the mother of learning) මෙම අදහස දක්වන අගාර්වල් (Aggarwal, 2005: 46) පෙන්වා දෙන්නේ පෙළඹීමක් නැතිව ඉගෙනීමක් සිදු විය නොහැකි බවයි (No learning is possible without motivation). සැබවින් ම ශිෂ්‍යයන්ට ඉගෙනීමට පෙළඹවීම සඳහා අනුගමනය කළ හැකි උපාය මාර්ග තීරණය කිරීමේ දී අධ්‍යාපන මනෝ විද්‍යාව මහෝපකාරී වන බව තවදුරටත් විග්‍රහකර දැක්වීම වැදගත් වේ.

සිසුන් පාඩමකට පෙළඹවීම සඳහා අධ්‍යාපන මනෝවිද්‍යාව සිසුන් අවධාරණය කරන උපාය මාර්ග රාශියකි. එනම් ආකර්ශනීය භෞතික හා පාරිසරික තත්වයක් නිර්මාණය කිරීම. (Attractive physical) ගුරුවරයාගේ මිත්‍රශීලී බැල්ම, (Teacher’s friendly look) සිනහව, ශිෂ්‍ය ප්‍රතිචාර හා දක්ෂතා අගය කිරීම, ඒවා කලු ලෑල්ලේ ලිවීම, මනෝ විද්‍යාත්මක ව ශිෂ්‍යයාගේ පෙළඹීම වැඩි කිරීමට බෙහෙවින් ම හේතු සාධක වන බව ය.

මේ අතර තෑගි සහ දඬුවම් ලබා දීම (Rewards and punishment) පෙළඹවීම වැඩි කිරීමට හේතු සාධක වන බව මනෝවිද්‍යානුකූල මතය යි. ද්‍රව්‍යාත්මක තෑගී (Material rewards)

දීමත්, සංකේතාත්මක තෑගී (Symbolic rewards) දීමත්, ගුරුවරු විසින් කළ යුතු බව මනෝවිද්‍යාව අවධාරණය කරයි. මීළඟට දඬුවම් ලබා දීම ද පෙළඹීමට හේතු සාධකයක් වේ. සිසුන්ට ලබා දෙන දඬුවම ශිෂ්‍යයා අධෛර්යයට පත් නොවන ධනාත්මක එකක් විය යුතු බව අවධාරණය කරයි. මෙහිදී මාස්ලෝ (Maslow, 1908-1970) පෙන්වා දෙන්නේ,

'පන්ති කාමරයේ ආලෝකය, වාතාශ්‍රය, හොඳින් තිබිය යුතු අතර අධික ශබ්දය තෙතමනය හෝ අධික උෂ්ණත්වය නොතිබිය යුතු බව ය. පංතිකාමර ගුරුවරයාට අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳ වැටහීමක් තිබේ නම් ශිෂ්‍යයාගේ මානසික රුචිකත්වය සතුට වර්ධනය වන පරදි පරිසරය සකස් කරයි.' යනුවෙනි.

ශිෂ්‍යයාගේ උනන්දුව වැඩි වීම සඳහා ගුරුවරයා විසින් විවිධ වෙනස්කම් කළ යුතු ය. වාචික හා අවාචික සන්නිවේදනය මනා ලෙස ගැළපිය යුතු වේ. එහිදී හොඳයි (Good) විශිෂ්ටයි (Excellence) වැදගත් (Important) යනා දී ධනාත්මක වචන භාවිත කළ යුතු බව පෙන්වා දෙයි. එහෙත් දුර්වලයි, වැරදියි, අන්තිමයි, බැරිවෙයි, නොහැකි වේ. කාණගාටුයි ආදි වචන භාවිත කිරීම සුදුසු නැත. තව ද අධ්‍යාපන මනෝවිද්‍යාවෙන් පෙන්වා දෙන්නේ ගුරුවරයාගේ කථා ශෛලිය ශිෂ්‍යයා භීතියට පත් නොවන පරිදි ධනාත්මක මානසික වර්ධනයට උචිත දඬුවම් මගින් පෙළඹීම ඉහළ දැමිය හැකි බවයි.

ජයග්‍රාහී අත්දැකීම් (Experience of success) ලබා දීම ද පෞද්ගලික විවිධතා (Individual differences) සැලකිල්ලට ගෙන ඉගැන්වීම ද පෙළඹීමට උචිත උපාය මාර්ග ලෙස සැලකේ. මේ අතර උචිත ආධාරක භාවිත කරමින් පාඩම ඉගැන්වීම, ඉගැන්වීම සරල ව ඉගැන්වීම, උදාහරණ සහිතව ඉගැන්වීම, දන්නා දේ සිට නොදන්නා දේට (From known to unknown) ඉගැන්වීම යන කරුණු ශිෂ්‍යයා පෙළඹීම සඳහා යොදා ගත හැකි මනෝවිද්‍යාත්මක මූලධර්ම බව ඒ අනුව පැහැදිලි වේ.

ශිෂ්‍ය අභිප්‍රේරණය වර්ධනය කිරීම සඳහා අධ්‍යාපන මනෝවිද්‍යාව කවර කාර්යභාරයක් ඉටු කරන්නේ ද යන්න අධ්‍යාපන මනෝවිද්‍යාව තුළ සාකච්ඡා කෙරෙන අභිප්‍රේරණ

න්‍යායන්ගෙන් පැහැදිලි වේ. සාමාන්‍ය මිනිසා ජීවිතයේ දී මෙන්ම අධ්‍යාපන කාර්යයේ දී ඇතිවන විවිධ ගැටලු විසඳීම උදෙසා මෙම න්‍යායයෝ වැදගත් කාර්යභාරයක් ඉටු කරති. එනම් ලැදියා න්‍යාය (Instincts theory), අවශ්‍යතා න්‍යාය (Need theory), චර්යාවාදී අභිප්‍රේරණ න්‍යාය (Behavioral theory), කාර්ය සිද්ධි අභිප්‍රේරණ න්‍යාය (Achievement theory of motivation), සන්දර්භගත අභිප්‍රේරණ න්‍යාය (Contexual theory of motivation), මනෝ විශ්ලේෂණවාදී න්‍යාය (Psychoanalitic theory), සමාජ න්‍යාය (Social theory), සංස්කෘතික න්‍යාය (Cultural patterns theory), ප්‍රොත්සාසා අභිප්‍රේරණ න්‍යාය (Incentive theory of motivation), ප්‍රජානාත්මක අභිප්‍රේරණ න්‍යාය (Cognative theory of motivation) ආදී වශයෙන් මෙම න්‍යායාත්මක එළඹුම් ඔස්සේ අධ්‍යාපනික සංවර්ධනයට සිදු වී ඇති දායකත්වය ඉහළ මට්ටමක පවතින බව (ජයවීර, 2023: 350) පෙන්වා දෙයි. අධ්‍යාපන මනෝවිද්‍යාව සාර්ථක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක අවශ්‍ය මනෝවිද්‍යාත්මක මූලධර්ම (Phychological Principles of teaching) මොනවාදැ'යි පෙන්වා දීමේ කාර්යය ඉටු කරයි. මෙම මනෝවිද්‍යාත්මක මූලධර්ම මොනවාදැ යි අගාර්වල් (Aggarwal, 2010: 67) ඉතා පැහැදිලි ව පෙන්වා දෙයි. එමෙන්ම ඉගැන්වීම කාර්යක්ෂම ලෙස සිදු කිරීමේ දී මෙම මූලධර්ම අවධාරණය කිරීම වැදගත් වේ.

ඉගැන්වීමේ දී සැලකිල්ලට ගත යුතු අධ්‍යාපන මනෝවිද්‍යාවේ විග්‍රහ කරන මූලධර්ම විග්‍රහයේ පහසුව තකා පහත දක්වනු ලැබේ.

1. ක්‍රියාකාරකම් මගින් ඉගැන්වීමේ මූලධර්මය
   (Principles of activity or learning by doing)

2. ක්‍රීඩා මගින් ඉගැන්වීමේ මූලධර්මය
   (Principle of playway)

3. ඉගැන්වීම පිළිබඳ පෙළඹවීමේ මූලධර්මය
   (Principle of motivation)

4. ස්වයං ඉගෙනුමකට යොමු කිරීමේ මූලධර්මය
   (Principle of self education)

5. පෞද්ගලික විවිධතා අනුව ඉගැන්වීමේ මූලධර්මය (Principle of individual difterences)

6. අරමුණු පිහිටුවා ගැනීමේ මූලධර්මය (Principle of goal setting)

7. කුතුහලය වර්ධනය කිරීමේ මූලධර්මය (Principle of stimulation)

8. සාමුහිකව ඉගෙනීමට යොමු කිරීමේ මූලධර්මය (Principle of association)

9. සූදානම් කිරීමේ මූලධර්මය (Principles of readiness)

10. අභ්‍යාස මඟින් ඉගැන්වීමේ මූලධර්මය (Principles of exercise)

11. වෙනස් වීම හා විවේකය පිළිබඳ මූලධර්මය (Principles of chomge and rest)

12. ප්‍රතිපෝෂණය හා දිරි ගැන්වීමේ මූලධර්මය (Principles of feed back and reinforcement)

13. සංවේදී පුහුණුව මගින් ඉගැන්වීම (Principles of training of senses)

14. නිර්මාණශීලීත්වය පිළිබඳ මූලධර්මය (Principles of creativity)

15. අත්දැකීම් මඟින් ඉගෙනීම (Learning by experience)

ඉගැන්වීම පිළිබඳ ඉහත මූලධර්ම ඕනෑම සංස්කෘතියකට වැදගත් වන විශ්ව අධ්‍යාපන ක්‍රියාවලියට ම ගැළපෙන ඒවා ලෙස සැලකිය හැකි ය. විශේෂයෙන් ම ක්‍රියාකාරකම්වලින් ඉගෙනීමෙන් සංවේදි ඉන්ද්‍රියයන් ක්‍රියාවට නැගෙන අතර ප්‍රායෝගිකත්වය, මතක

ශක්තිය, තවදුරටත් වර්ධනය වේ. එනම් ක්‍රියාකාරකම් මගින් ඉගෙනීම යනු ශාරීරික ක්‍රියාකාරකම් පමණක් නොවේ. ශාරීරික හා මානසික වූ සියලුම ක්‍රියාකාරකම් ඔස්සේ සිය පෞරුෂය සංවර්ධනය කර ගැනීමයි. එය ඉන්ද්‍රිය සංවේදී ඉගෙනීමක් ලෙස සැලකේ. ශිෂ්‍යයාගේ ළමා කාලයේ ප්‍රධානතම ක්‍රියාකාරකම ක්‍රීඩාව, නැත්නම් සෙල්ලම් කිරීම (Play is the chief activity of child) බව ෆ්‍රොබෙල් (Frobel, 1999) පෙන්වා දෙයි. එම නිසා මෙම මූලධර්මය මත ඉගැන්වීම ළමයාගේ පෞරුෂ වර්ධනයට හේතු සාධක වේ.

ළමුන් එකට එක්වී ඉගෙනීම ඔවුන් තේරුම් ගැනීමට හා අන්තර් සබඳතාවට (Then it becomes easier to make the students understand their relationship) වඩාත් පහසු බව තොන්ඩයික් පෙන්වා දෙයි. මේ අනුව විවිධ අදහස් එකිනෙකාට එකතු වෙමින් එකම අදහසක් ඇති කර ගැනීමෙන් එකට ජීවත් වීමේ හැකියාව ද (learning live together) වර්ධනනය කර ගත හැකි ය. මේ අතර ඉගෙනීමට සූදානම් කිරීමේ ක්‍රමය ඉතාම ඵලදායි ක්‍රමයකි. බොහෝ ගුරුවරුන් ඉගැන්වීමට සූදානම් වුවත් ළමයා ඊට සූදානම් දැයි විමසා නොබැලීමෙන් ඉගෙනීම හා ඉගැන්වීම අවුල් සහගත තත්වයකට පත්වේ.

අධ්‍යාපන ක්‍රියාවලිය තුළ නිරත ළමුන් ඉගෙන ගන්නේ කෙසේ ද උගන්වන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව න්‍යායාත්මක අවබෝධය ලබා දීම සම්බන්ධ ව අධ්‍යාපන මනෝවිද්‍යාවෙන් ඉටු කෙරෙන බුද්ධිමත් හා විද්‍යාත්මක කාර්යභාරය බෙහෙවින් වැදගත් වේ. ඉගෙනීම පිළිබඳ අධ්‍යාපන මනෝවිද්‍යාවෙන් මග පෙන්වන ඉගෙනුම් න්‍යායයන් (Learning theories) ගුරුවරයාගේ වෘත්තීය දක්ෂතා (Professional skills qualities) සංවර්ධනය කරන අතර ගුරු භූමිකාව බොහෝ දුරට ශක්තිමත් කෙරේ. මෙම න්‍යායයන් පිළිබඳ සංක්ෂේපයෙන් වුව විමසා බැලීමේ දී අධ්‍යාපන මනෝ විද්‍යාවේ කාර්යභාරය කෙතරම් ගැඹුරට හා පුළුල් වී ඇත්දැයි අවබෝධ කර ගත හැකි ය.

විග්‍රහයේ පහසුව තකා ඉගෙනීම පිළිබඳ අධ්‍යාපන මනෝ විද්‍යාවේ විග්‍රහ කෙරෙන න්‍යායයන් කිහිපයක් පහත දැක්විය හැකි ය.

1. ඉගෙනුම පිළිබඳ ප්‍රබෝධක ප්‍රතිචාර න්‍යාය

2. ඉගෙනුම පිළිබඳ සම්භාව්‍ය ආරෝපණ න්‍යාය

3. ඉගෙනුම පිළිබඳ ස්කිනර්ගේ ප්‍රකාරක ආරෝපණ න්‍යාය

4. ඉගෙනුම පිළිබඳ ක්ෂේත්‍ර ප්‍රජානන න්‍යාය

5. පුනරාවර්ජන න්‍යාය

ඊ.එල්. තෝන්ඩයික් (1974- 1948) ඉදිරිපත් කළ ප්‍රබෝධක ප්‍රතිචාරය සංයෝජන න්‍යායයෙන් ළමයෙකුගේ ඉගෙනුම සිදු වන්නේ කෙසේ ද යන්න මැනවින් පැහැදිලි කරයි. බළලකු පරීක්ෂණ පෙට්ටියකට දමා කරන ලද මෙම අත්හදා බැලීමේ න්‍යායයෙන් ඉදිරිපත් කළ අභ්‍යාස නීතිය, ඵල නීතිය හා සූදානම් නීතිය ගුරුවරුන්ට මෙන්ම ළමයින්ට බෙහෙවින්ම වැදගත් වේ. අභ්‍යාස නීතිය මගින් පෙන්වා දෙන පරිදි ශිෂ්‍යයින් ලබන දැනුම හා අත්දැකීම් නැවත නැවත භාවිතය සඳහා සුදුසු අවස්ථා ලබා දීමෙන් ශිෂ්‍ය ඉගෙනුම වර්ධනය කළ හැකි ය. එමෙන්ම ශිෂ්‍යයින්ගේ ස්මරණය සංවර්ධනය කිරීම සඳහා තමා උගත් කරුණු නැවත නැවත පරික්ෂා කර බැලීම වැදගත් වේ. එමෙන්ම ප්‍රබෝධක (S) ප්‍රතිචාර (R) බන්ධන න්‍යාය තහවුරු වීම සඳහා නිතර නිතර අභ්‍යාස ලබා දීම බෙහෙවින් ම මනෝවිද්‍යාත්මක මඟ පෙන්වීමකි.

එමෙන්ම එම නීතිය යටතේ පංතිකාමර ඉගෙනුම් අවස්ථා ඉතා ප්‍රසන්න විය යුතු බවත්, ඉගැන්වීමේ ක්‍රියාවලියෙන් සූදානම් නීතිය පන්තිකාමර ක්‍රියාවලියට ඉතා සාර්ථක ලෙස යොදා ගත හැකි ය. තෝන්ඩයික් ගේ ප්‍රබෝධක ප්‍රතිචාර න්‍යායයන් ඉදිරිපත් කෙරෙන මෙම නීති තුන පංතිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට ගුරුවරයා විසින් ඉතා සාර්ථක ව යොදා ගැනීමෙන් විශිෂ්ට ප්‍රතිඵල අත්පත් කර ගත හැකි ය.

මේ අතර ඉගෙනුම පිළිබඳ සම්භාව්‍ය ආරෝපණ න්‍යාය ඉවාන් පැව්ලොව් (1849-1936) ඉදිරිපත් කර තිබේ. මෙම න්‍යායට අනුව ගුරුවරයාට පන්තිකාමරය තුළ ළමුන්ට ඉගැන්වීමේ දී

අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග රාශියකි. ඒවා පහත සඳහන් පරිදි තව දුරටත් වඩා පැහැදිලි ව අවබෝධ කර ගත හැකි ය.

- ශිෂ්‍ය පෞරුෂය බිඳ නොවැටෙන පරිදි ගුරුවරයා ක්‍රියා කළ යුතු ය.
- ගුරුවරයා ළමයාට ප්‍රශංසා කිරීම අවශ්‍ය වේ.
- ශිෂ්‍යයින්ගේ ඉගෙනුම් ප්‍රතිචාර උපස්ථම්භනය කළ යුතු ය.
- ළමුන්ගේ ආත්ම විශ්වාසය ක්‍රමානුකූලව වර්ධනය කළ යුතු ය.
- දඬුවම් දීමකින් තොරව අහිතකර ප්‍රතිචාර වැළැක්විය යුතු ය.
- ළමුන් විෂයයට කැමැත්ත ඇති කිරීමේ උපායශීලි ක්‍රියාමාර්ග සංවර්ධනය කළ යුතු ය.
- පෙළඹවීම සඳහා උපායමාර්ග භාවිත කිරීම අවශ්‍ය වේ.
- වැරදි ප්‍රතිචාර වෙනුවට හිතකර ප්‍රතිචාරවලට ළමයා යොමු කළ යුතු ය.
- ස්වයං ඉගෙනුම වැඩෙන පරිදි ඉගැන්විය යුතු ය.
- අයහපත් පුරුදු, භාවිතයන් ළමයාට හානියක් නොවන පරිදි ඉවත් කළ යුතු ය.

මෙලෙස ඉගැන්වීම් ක්‍රියාවලියෙන් ළමයාට කිසියම් ප්‍රීතියක් භුක්ති විඳීමට ඉඩකඩ ලබා දිය යුතු බවත් කිය වේ. එමෙන්ම ගුරුවරයා විසින් ලබා දෙන ඉගෙනුම් අත්දැකීම් ළමයාට අර්ථවත්ව විඳ දරා ගැනීමට හැකි විය යුතු ය. මේ අතර ඒවා සංවිධානය කළ යුත්තේ ශිෂ්‍යයාට ක්‍රමානුකූල ව සතුටුදායක ප්‍රතිඵල අත්වන පරිදි ය.

එමෙන්ම ඉගෙනුම් තොරතුරු (learning impromation) ඉදිරිපත් කරන මාධ්‍යයන් විවිධ විය යුතු ය. විවිධ ක්‍රමවලින් සහ

උපක්‍රමවලින් තොරතුරු සම්ප්‍රේෂණය කරන විට ශිෂ්‍යයින් ඊට දක්වන ඇල්ම වැඩි වේ. විශේෂයෙන්ම සූදානම් නීතියේ දී පෙන්වා දෙන්නේ ඉගෙනුම සඳහා ළමයා සූදානම් වන තුරු ඉගැන්වීමෙන් ඵලයක් නොවන සාමාන්‍ය ළමයාගේ ස්වභාවය අවබෝධ කර ගැනීමට අධ්‍යාපන මනෝවිද්‍යාව ගුරුවරයාට ප්‍රබල මගපෙන්වීමක් කරයි. නූතන අධ්‍යාපන මනෝවිද්‍යාඥයින්ගේ සුවිශේෂී අවධානය යොමුවන වැදගත් තැනක් ලෙස පුද්ගල විවිධත්වය හඳුනා ගැනීම (ඤාණසාර හිමි, 2008: 104) පෙන්වා දිය හැකි ය. පන්තිකාමරයක සිටින සිසුන්ගේ කායික, මානසික චිත්තවේගීය වශයෙන් ඇතිවන ආකල්ප අදහස්, උදහස් සිතුවිලි එකිනෙකට වෙනස් ය. මෙම පෞද්ගලික විවිධතාවන් (Individual differences) හඳුනා නොගෙන ශිෂ්‍යයා සංවර්ධනය කිරීමට මග පෙන්වීම දුෂ්කර කාර්යයක් (chuhan, 1978) බව පෙන්වා දෙයි. එම නිසා ශිෂ්‍ය විවිධත්වය හඳුනා ගෙන ඉගැන්වීමට අධ්‍යාපන මනෝවිද්‍යාව ප්‍රබල මග පෙන්වීමක් සිදු කරයි.

විශේෂයෙන් ම මේ පිළිබඳ අදහස් දක්වන මැක්ඩොනල්ඩ් (Macdonald, 1959: 419) පෙන්වා දෙන්නේ ආරය හා පරිසරයේ බලපෑමෙන් ඇති වන මෙම පුද්ගල විවිධත්වය හඳුනා ගැනීම වැදගත් බවයි. එමෙන්ම බර්නාඩ් (Bernard, 1965: 375) පෙන්වා දෙන්නේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පුද්ගල විවිධත්වය සැලකිල්ලට ගෙන ක්‍රියාකිරීම බෙහෙවින් ම අවශ්‍ය බව ය. එමෙන්ම ප්ලෙමින් (Pleming, 1969: 98) පෙන්වා දෙන්නේ ගුරුවරයා ශිෂ්‍යයාගේ පෞද්ගලික විවිධත්වය සැලකිල්ලට ගනිමින් ඉගැන්වීම කළ යුතු බවයි. මේ අතර ලොවෙල් (Lovel, 1962) පෙන්වා දෙන්නේ ගුරුවරයා උගන්වන විෂය පිළිබඳ පමණක් නොව ඉගෙන ගන්නා ළමයා පිළිබඳ ව ද අවබෝධයක් ලබා සිටීම ඉගෙනුම සාර්ථක වීමට හේතු සාධක වන බවයි. මේ අතර පියාජේ (Piaget, 1950) පෙන්වා දෙන්නේ ළමයාට සාර්ථක අධ්‍යාපනයක් ලබා දීමට නම් ළමයාගේ ප්‍රබලකම් මෙන්ම දුබලකම් ද දැන සිටීම වැදගත් වන බවයි.

මෙලෙස සිසුන් කණ්ඩායමක් වශයෙන් සලකන විට ගුරුවරයා උගන්වන දෙය එලෙසම ඉගෙන ගන්නේ ඉතා සුළු පිරිසකි. සමහර ළමුන් අතර උදාසීන බව, මතකය පිළිබඳ ගැටලු, චර්යාමය ගැටලු, තේරුම් ගැනීමේ අපහසුව, රුචිකත්වය අඩුවීම, ඉන්ද්‍රියමය ආබාධ

වැනි විවිධ ලක්ෂණ ඇති සිසුන් ඇත. මෙහිදී මෙවැනි විෂම පුද්ගල ලක්ෂණ ඇති පංති කාමරයක ඉගැන්වීම අතිශයින් සංකීර්ණ කාර්යයකි. මෙම ඉගැන්වීමේ කාර්යය ළමුන්ගේ විවිධත්වය හඳුනා ගෙන එම විවිධතාවලට ගැළපෙන ලෙස සාර්ථක ව කිරීමට ගුරුවරයාට හැකියාවක් ලැබෙනුයේ අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳ දැනුම නිසි පරිදි ලබා ගැනීමෙන් පසුව ය. එපමණක් නොව ළමුන් සම්බන්ධ ගැටලුවල දී අදාළ දෙමාපියන්ට අවවාද උපදෙස් ලබා දිය හැක්කේ ද මනෝවිද්‍යා දැනුම ඔස්සේ ය.

විශේෂයෙන්ම බෞද්ධ අධ්‍යාපන මනෝවිද්‍යාව සලකා බලන විට ලොවට ම විශිෂ්ට වු ගුරුවරයෙක් ලෙස බුදුන් වහන්සේ මෙම පුද්ගල විවිධත්වය සැලකිල්ලට ගෙන ඉගැන්වූ බව අංගුත්තර නිකායේ පටිභාන පුද්ගල සූත්‍රය, ගරු පුග්ගල සූත්‍රය, වජ්ජි පුග්ගල සූත්‍රය, නෙයාපුග්ගල සූත්‍රය, කන්දරක සූත්‍රය ආදී සූත්‍රවලින් පැහැදිලි වේ. මෙම සත්‍යය මේධානන්ද හිමි මජ්ඣිම නිකායේ කන්දරක සූත්‍රය ද සැලකිල්ලට ගනිමින් මෙසේ ප්‍රකාශ කරයි.

''ලෝකය ආනේකාකාර වූ විවිධ විචිත්‍ර වූ කායික ස්වභාවිකත්වයෙන් ද එබඳුම වූ මානසික ගති ලක්ෂණයන්ගෙන් ද යුක්ත සමාජයකින් සමන්විතය. එබඳු විවිධත්වයන් විෂමත්වයන් තිබිය දී ඒ සැමට ගැළපෙන සේ ඒ සැමගේ හිත අහිත දැන දැක ඒ සැම උදෙසාම උචිත වන සන්නිවේදනයක නිරත වීම සැබවින් ම දුෂ්කරය. එබදු පුද්ගල වේමත්තතාවයකින් යුත් සම නොවූ විෂම සමාජයක සැමට ගැළපෙන සේ සැමගේ හිත සුව දැන දහම් දෙසීමට බුදුරජුන් සමත්වීම ගැන ඇතැම් සමකාලීනයෝ විමතියට පත් වූහ. මිනිස්සු විවිධ අදහස් ඇත්තෝ ය. සිතුම් පැතුම් ද ගතිගුණ ද විවිධ ය. ඔවුන් අනේක විධ පාපී සිතුවිල්ලෙන් කිලිටිව සිටිති. සට කපට ද වෙති. කුහක ද වෙති. එබඳු වූ ලෝකයේ භාග්‍යවතුන් වහන්සේ සැමගේ හිත අහිත දැන සැමට උචිත වන දහමක් දෙසීම නම් අසිරිමත් කරුණකැයි බුදුරදුන් හමු වූ එක්තරා ඇතරුවෙක් බොදුනුවෙකු පැවසූ සැටි පෙළ දහම වාර්තා කරයි. එතෙක් විෂම වූ ලෝකයට, විවිධත්වයෙන් යුතු සමාජයට සමවූ දහමක් සන්නිවේදනය කිරීමේ හැකියාව ද බුදුරජුන්ගේ පරමාදර්ශය මැවේ.''

මේ අනුව පැහැදිලි වන්නේ බෞද්ධ අධ්‍යාපන මනෝවිද්‍යාව (Buddhist Education Psychology) මගින් ද පුද්ගල විවිධත්වය අවබෝධ කර ගෙන ඉගැන්වීමට විද්‍යාත්මක මග පෙන්වීමක් කර ඇති බව ය.

අධ්‍යාපන මනෝවිද්‍යාව පාසල් සංස්කෘතිය තුළ අන්තර් සම්බන්දතා පවත්වා ගැනීමට මග පෙන්වීමක් සිදු කෙරේ. ඔක්ස්පර්ඩ් ශබ්දකෝෂයට (Oxford Dictionary, 1989: 1085) අනුව අන්තර් සබඳතා පවත්වා ගැනීම යනු පුද්ගලයන් අනෝන්‍ය වශයෙන් ක්‍රියා කිරීමයි. මේ පිළිබඳ අදහස් දක්වන රොසන්තල් සහ ජැකෝබ්සන් (Rosenthal & jocobsony, 1968: 66) පෙන්වා දෙන්නේ ගුරුවරයා ළමයා සමග ශුභවාදීව අන්තර් ක්‍රියාකාරණයේ යෙදීම ළමයාගේ බුද්ධිමය පිබිදීමට (Intellectual bloom) මෙන්ම ස්වාර්ථ සාධනය පිණිස සෘජු බලපෑමක් කරන බව ය. මෙම මනෝවිද්‍යාඥයින් දෙදෙනා තවදුරටත් පෙන්වා දෙන්නේ ගුරුවරයාගේ අන්තර් ක්‍රියාකරණය යහපත් වීම හේතු කොට ගෙන ළමයා ප්‍රතිජනනාත්මක පෙළඹීමකට ලක් වන බව ය. එම නිසා අධ්‍යාපන මනෝවිද්‍යාව මගින් තවත් අයෙක් සමග වඩාත් හිතකර වූ කායික, මානසික, වාචික හා අවාචික වශයෙන් අන්තර් ක්‍රියාකරණයේ යෙදිය යුත්තේ කෙසේදැ'යි මඟපෙන්වීම යි.

ගුරුවරයාට හා ශිෂ්‍යයාට තම කාර්යය සාර්ථක ව ඉටුකර ගැනීමේ දී විවිධ පුද්ගලයින් සමග සම්බන්ධතා පැවැත්වීමට සිදුවේ. එනම් ශිෂ්‍යයින්, ගුරුවරු, විද්‍යාලාධිපති, අංශභාර ගුරුවරු, දෙමව්පියන්, අවට ප්‍රජාව, නිලධාරීන්, රාජ්‍ය ආයතන, ස්වේච්ඡා ආයතන ආදී වශයෙන් සම්බන්ධතා ගොඩනගා ගැනීමට සිදුවේ. මෙහිදී අවශ්‍ය පරිචය ලබා ගත හැක්කේ අධ්‍යාපන මනෝ විද්‍යාවෙන් ය. මේ පිළිබඳ අදහස් දක්වන මීඩ් පෙන්වා දෙන්නේ සංකේතාත්මක අන්තර් ක්‍රියාකරනය පවා මනෝවිද්‍යානුකූල පදනමකින් සාර්ථක ව සිදුවන බව ය.

අධ්‍යාපන මනෝවිද්‍යාවේ තවත් වැදගත් කාර්යයක් වන්නේ පුද්ගල පෞරුෂය සංවර්ධනය කර ගන්නේ කෙසේ ද යන්න පිළිබඳ මඟ පෙන්වීම ය. අධ්‍යාපන ක්‍රියාවලියේ දී ශිෂ්‍යයාගේ පෞරුෂය ධනාත්මක වැඩෙන ලෙසත් පෞරුෂයට හානි නොවන ලෙසත්

ක්‍රියා කළ යුතු ය. මේ සඳහා ගුරුවරුන්ට හා දෙමාපියන්ට අවශ්‍ය සියලු දැනුම් සම්භාරය විවිධ මනෝවිද්‍යාඥයින් විසින් ඉදිරිපත් කර තිබේ. සිග්මන් ෆ්‍රොයිඩ්, හැඩින් හර්ස්ට් (Havigurst, 1972), බැන්ඩුරා (Bandura, 1977), පියාජේ (Piaget), කොල්බර්ග් (Kohl berg, 1963) ආදී මනෝ විද්‍යාඥයින් පාසලේ දී ළමයාගේ සමබර පෞරුෂය දියුණු කිරීමට අධ්‍යාපනය කෙසේ ලබා දිය යුතු ද යන්න පැහැදිලි කර තිබේ.

අධ්‍යාපන මනෝවිද්‍යාව අවධාරණය කරන පරිදි සෑම ළමයෙකුගේ ම පෞරුෂය සංවර්ධනය කර ගැනීමට අවශ්‍ය පසුබිම සැලසිය යුතු ය. ඊට හේතුව පුද්ගලයාගේ ක්‍රියාකාරීත්වය චින්තන විධි හා සංවේද අනුව සෑම පුද්ගලයෙකුට ම අසම හා අති විශිෂ්ට වන බව බෙන්ජමින් (Benjomin, 2001: 460) පෙන්වා දෙයි. කාල් රොජර්ස් (Rogers, 1942) පෙන්වා දෙන්නේ සෑම පුද්ගලයෙක් ම තමාගේ ජීවිතය හසුරුවා ගත යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ වැටහීමක් ඇතිව සිටින අතර පෞරුෂ හැකියාවක් සහිත ව සිටින බව ය. අධ්‍යාපනය මගින් එම පෞරුෂ ශක්තීන් අවධි කර ගැනීමට මඟ පෙන්වීම වැදගත් වේ. අධ්‍යාපන මනෝවිද්‍යාව ඔස්සේ පුද්ගල පෞරුෂය ගැඹුරට විග්‍රහ කිරීම සඳහා ගති ලක්ෂණ සුවිශේෂය මනෝවිශ්ලේෂණ ප්‍රවේශය ආදි විග්‍රහයන් හඳුන්වා දී තිබේ. මේ අනුව පෞරුෂය කෙරෙහි බලපාන ජීව විද්‍යාත්මක සාධක (Biological factors) පුද්ගල හැකියා අතර වෙනස්කම එම සංකල්ප වර්ධනය කරන්නේ කෙසේ ද පෞරුෂය සංවර්ධනය කිරීමේ දී සමාජීය හා චිත්තවේගීය සාධක සාරධර්ම සංවර්ධනය කරන්නේ කෙසේ ද ආදී වශයෙන් විවිධ මඟ පෙන්වීම් කර තිබේ. මෙලෙස ශිෂ්‍යයාගේ පෞරුෂ වර්ධනය ස්ව සංකල්ප වර්ධනය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ ව ද මඟ පෙන්වයි. ඒ අනුව ළමුන්ට පංති කාමරයේ දී සියලු ආකාරයේ සහභාගී වීම් සලසා දීම, සියලු ආකාරයේ හැඟීම් ප්‍රකාශයට අවස්ථා සලසා දීම, පිළිගනු ලැබීමට සලසන පන්තිකාමර වාතාවරණයක් ගොඩ නැගීම, පංති කාමරයේ ඉතා පැහැදිලි නීතිරීති මාලාවක් පැනවීම, ළමයින්ට තම තමන්ගේ ජයග්‍රහණය සඳහා අදාළ වන විවිධ ක්‍රියාමාර්ග අවධාරණය කිරීම බෙහෙවින් ම වැදගත් බව පෙන්වා දී ඇත. මෙලෙස සමාජයක ජීවත්වන පුද්ගලයින්ගේ පෞරුෂ වර්ධනය උපතේ සිට ම සිදු කළ යුතු බවත්, මේ සම්බන්ධ අධ්‍යාපන මනෝවිද්‍යාව පාසල් ගුරුවරුන්ට, විෂයමාලා සම්පාදකයින්ට, දෙමව්පියන්ට නිසි මග පෙන්වීමක් කිරීමෙහි කාර්යභාරය විශිෂ්ට වේ.

අධ්‍යාපන මනෝ විද්‍යාවේ තවත් වැදගත් කාර්යයක් ලෙස විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සංවර්ධනය කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ මග පෙන්වීම් හඳුන්වා දිය හැකි ය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ දී හමුවන මෙම විශේෂ අවශ්‍යතා ඇති ළමුන් විවිධ වේ. මේ අතර කායික ඌණතා ඇති ළමයි, සෙමින් ඉගෙන ගන්නා ළමයි හා බාලාසමාරි ළමයි කෙරෙහි විශේෂයෙන් ක්‍රියා කළ යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ ගුරුවරයාට දැනගත හැක්කේ අධ්‍යාපන මනෝවිද්‍යාවට අනුවයි. විශේෂයෙන් ම පංතිකාමරයේ දී විශේෂ අවශ්‍යතා ඇති ළමුන් (ජා.අ. ආයතනය, 1989) ගුරුවරයාට හමු වේ. එනම් අන්ධතාවය, දුර නොපෙනීම, ළඟ නොපෙනීම, පෙනීමේ ක්ෂේත්‍ර සීමා වීම ආදී ගැටලු සහිත දෘශ්‍යාබාධිත ළමුන් හමුවේ. එමෙන් ම, ඇදහීමේ ඌණතාව ඇති, තරමක් ඌණතාව ඇති, බොහෝ දුරට ඌණතාව ඇති, ප්‍රබල ඌණතාව ඇති, ඉතා ප්‍රබල ඌණතාව ඇති, ශ්‍රවණ ඌණතා සහිත ළමුන් සම්බන්ධයෙන් ගුරුවරයා ක්‍රියා කළ යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ අධ්‍යාපන මනෝවිද්‍යාව මග පෙන්වීම් කරයි. තව ද පාසල් තුළ වැඩි වශයෙන් ම දක්නට ලැබෙන්නේ කථා කිරීමට අපහසු ළමයින් ය. එනම් ශබ්ද උච්චාරණ අපහසුතාව, ගොත ගැසීම, දිග් ගැස්සීම පුනරුක්තය, විකල් ගැසීම, වචන පැටලීම සිදුවන ළමුන් සිටී. මෙවැනි කථනාබාධිත ළමුන් සඳහා ගුරුවරයා සහයෝගය දැක්විය යුත්තේ කෙසේද යන්න පිළිබඳ අධ්‍යාපන මනෝවිද්‍යාව ප්‍රබල, මග පෙන්වීමක් කරයි.

මෙලෙස පාසලක අංග විකල භාවයෙන් පෙළෙන ළමයි සෙමෙන් ඉගෙන ගන්නා ළමයි (slow learners), අපචාරි ළමයි (delingnent students), ආතතියෙන් පෙළෙන ළමයි, ඉන්ද්‍රිය දුබලතා ඇති ළමයි (children with physical defects), ඉගෙනුම් නොහැකියා සහිත ළමයි (children with learning difficulties), සුහග ළමයින් (gifted children), ආදී වශයෙන් විශේෂ අවශ්‍යතා ඇති ළමයින් (children with special needs) රාශියක් හමු වේ. මොවුන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම ගුරුවරයා වෙත පැවරෙන ප්‍රබල වගකීමකි. මේ සම්බන්ධයෙන් ගුරුවරයාට පමණක් නොව අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලී වගකිව යුතු අයට අධ්‍යාපන මනෝවිද්‍යාවෙන් කෙරෙන මගපෙන්වීම බෙහෙවින්ම අවශ්‍ය වේ.

අධ්‍යාපන මනෝවිද්‍යාවේ කාර්යභාරය සමාජ සංවර්ධනය (social development) ප්‍රබල බලපෑමක් කෙරේ. විශේෂයෙන් ම ළමුන්ගේ චිත්තවේගී අසහනයන් අවබෝධ කර ගෙන වඩාත් හොඳ ඉගැන්වීමක් සිදු කිරීම සමාජ සංවර්ධනය, චරිත සංවර්ධනයට බෙහෙවින් ම බලපායි. ළමයාගේ මානසික සෞඛ්‍යය සංවර්ධනය වන තරමට ඉගෙනීම වර්ධනය වේ. මෙහිදී ළමුන්ගේ චිත්වේගී තත්වයන් හරිහැටි අවබෝධ කරගෙන අසහනකාරී තත්වයන් ඉවත් වී චිත්වේගී සංවර්ධනයක් ඇතිවන පරිදි ළමයාගේ මනස හැඩ ගැස්වීම ගුරුවරයා විසින් කළ යුතු ය. විෂය කරුණුවලට අමතරව ගුරුවරයා විසින් කළ යුත්තේ කුමක් ද යන්න අවබෝධ කර ගත යුතු ය. මේ සඳහා අධ්‍යාපන මනෝවිද්‍යාවෙන් කෙරෙන මග පෙන්වීම් අධ්‍යයනය කිරීම වැදගත් වේ.

අධ්‍යාපන මනෝවිද්‍යාවේ තවත් වැදගත් කාර්යයක් ලෙස සැලකිය හැක්කේ ඉගැන්වීම් න්‍යාය හා උපක්‍රම පිළිබඳ අවශ්‍ය දැනුම ලබා ගැනීමට මඟ පෙන්වීමය. ඉගැන්වීම සාර්ථක වන්නේ ළමුන්ට විෂය කරුණු තේරුම් යන පරිදි ඉගැන්වීමෙන් බව පෙන්වා දිය හැකි ය. මෙහිදී ඉගැන්වීම් ක්‍රියාවලියේ කුමක් උගන්වන්නේ ද කෙසේ (how) උගන්වන්නේ ද කොයි වෙලාවේ උගන්වන්නේ ද කොතරම් ප්‍රමාණයක් උගන්වන්නේ ද යැයි තීරණය කිරීමට අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳ දැනුම අවශ්‍ය වේ.

මේ අනුව අධ්‍යාපන මනෝවිද්‍යාවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයට ඉටු වන මෙහෙය මෙතෙකැයි ප්‍රමාණය කළ නොහැක. අධ්‍යාපනය ඔස්සේ සමාජ සංවර්ධනයට අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්ප නිවැරදි පරිදි ළමා ජීවිත තුළ ගොඩනැගීමට අධ්‍යාපන මනෝවිද්‍යාවේ දායකත්වය වැදගත් වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

*අංගුත්තර නිකාය.* බු.ජ.ත්‍රි.ග්‍ර.මා. (1962). චතුක්ක නිපාතය. නෙයාපුද්ගල සූත්‍රය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

කොතලාවල, එල්සි (1979). *පියාජේගේ මනෝවිද්‍යා න්‍යාය.* කොළඹ: ලේක්හවුස් ප්‍රකාශන.

ජාතික අධ්‍යාපන ආයතනය (1989). *අධ්‍යාපනයේ මනෝ විද්‍යාත්මක පදනම*. මහරගමඃ ජාතික අධ්‍යාපන ආයතනය.

*මජ්ඣිම නිකාය 2*. බු.ජ.ත්‍රි.ග්‍ර.මා. (1973). ගහපති වර්ගය. කන්දරක සූත්‍රය. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

බණ්ඩා, සමරකකෝන් (2011). *ගුරු භූමිකාව පිළිබඳ ථෙරවාදී සංකල්පය*. දර්ශනශූරි උපාධි නිබන්ධනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

හපුආරච්චි (2012). *උපදේශන මනෝවිද්‍යාව*. සුවාශික ප්‍රකාශන අංක 200, කමතවත්ත පාර, රාජගිරිය.

හේමාරණවක (2014). *උපදේශනය*. කොළඹ විශ්වවිද්‍යාලය, කොට්ටාවඃ සාර ප්‍රකාශන.

*විදුරුපොල මානාභිමි ශාස්ත්‍රය සංග්‍රහය* (2008ඃ 104). ඥාණසාර හිමි. 'බෞද්ධ මනෝ විද්‍යාව පිළිඹිබු කරන පුද්ගල විවිධත්වය.' මත්තේගොඩඃ මයුරි ප්‍රකාශකයෝ.

Benjamin, L. (2001). *Psychology*, *An introduction*. The Mc Grow- Hill (USA)

Bernard H.W. (1965). *Psychology of learning and teaching*. ed grow hill bool co.

Blumer, It (1969). *Symbolic interactiosism: Perspective and Method*. Engtewrod cliff, N. 1. Prentice. Hall.

Fleming, C.M. (1969). *Teaching and psychology*. Analysis Marhuen and co.Ltd, London.

Frobel, f. (1909). *The educttion of man*, Tr by W.N, Halmann, New York, Applicattion.

Havighurst. R.J. (1977). *Social learning Theory*. EngleWood cliffs, N.J. Arentice Hall,

Kohlbery, L. (1963). *Moral de devopment and itentifieation*. N.S.S.E year Book, vol. 62 Port 1.

Linda Seligman, lourie Reichenberg (2010). *Theories of counseling psycho therapy*. New Dhilhi, India.

Lovel, K, (1962). *Educational Psychology and Children*. London university Press.

Macdonald, Ft. (1959). *Educational phychology*. words worth publishing co.

Mehe/GTZ project (1996). *Education Psychology*. Ministry of education & Higher education, Colombo.

*Oxford Dictionary*. 2006:124 oxoerd university press.

Piagets (1950). *Psychology of intelligence*. London.

Rogers, C.R. (1942). *Conselling and phychot heraphy*. Boston Houghtion.

Rosenthal, R. & Jacohson, (1968). *Pygmalion in the Classroon*: *Teacher expectation and pupil's intellectual development*. New York, Holt Rinehorrt & Winston.

Simpson,J.A. and Weiner E.s. (1989). *The Oxford English Dictionary*. Clarencton Press Oxford